# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2472/22 - 2026 ජනවාරි මස 21 වැනි බදාදා - 2026.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

34 වන වගන්තිය යටතේ වූ නියමය

2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 34 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඩිජිටල් ආර්ථික අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මා විසින්, අවශ්‍ය යටිතල පහසුකම්, වැඩපිළිවෙල සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කරන තුරු, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 6, 9,14, 16 හා 17 වන වගන්ති සහ එම පනත යටතේ සාදන ලද සෑම නියෝගයක්ම (1990 නොවැම්බර් 20 වන දින අංක 637/6 දරන *ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබූ 1990 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝග හැර) ක්‍රියාත්මක වීමේ කාල සීමාව අවසන් වන දිනය වශයෙන් 2016 අගෝස්තු මස11 වන දින අංක 1979/40 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබූ දිනය, 2026.12.31 දින වශයෙන් මෙම නියමය මගින් වෙනස් කරමි.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති හා ඩිජිටල් ආර්ථික අමාත්‍ය.

2026 ජනවාරි මස 18 දින.

EOG 01 - 0219

1A - G 46154 — 04 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*